# සොඳුරු බින්තැන්න විදේශීය සංචාරක ආකර්ෂණයක් ලෙස ප්‍රවර්ධනය කරන්නේ කෙසේ ද යන්න පිළිබඳ කරන අධ්‍යයනයක්.

දහම් ප්‍රේමතිලක, තශ්මිලා රෝෂිණී චන්ද්‍රපාල*

බින්තැන්න ලෙස හඳුන්වා දී ඇත්තේ ඌව පළාතේ බදුල්ල දිස්ත්‍රික්කයේ මහියංගනය ප්‍රදේශයයි. මෙම බින්තැන්න ප්‍රදේශය තුළ සුවිශේෂී වූ සංචාරක ආකර්ෂණීය ස්ථාන පවතී. එහි ද සොරබොර වැව, දඹාන ආදිවාසි ජනාවාසය, රත්න ඇල්ල, මහයිංගනය රජමහා විහාරය ප්‍රධාන වේ. බින්තැන්න ප්‍රදේශයේ සොරබොර වැව මෙරට පැරණිතම වැවක් ලෙස හැදින්විය හැක. සොරබොර වැවට ආවේනික වූ සුවිශේෂ වාරි තාක්ෂණයක් ද ඇත. දඹාන ආදිවාසි ජනාවාසය මෙරට ස්වදේශීය ජනතාව වාසය කරන සුවිශේෂිතම ප්‍රදේශය යි. ආදිවාසින්ට ආවේණික වූ සුවිශේෂී සංස්කෘතියක් පවතී. ආදිවාසන් සතු ජීවන රටාව, ඇදහිලි ක්‍රම, ආහාර සංස්කෘතිය ආදි ඔවුන්ට විශේෂ වූ පාරම්පරික වටිනා ජීවන සංස්කෘතියක් පවතී. මහයිංගනයට ආසන්න වූ හසලක ප්‍රදේශයේ ඇති රත්න ඇල්ල ලංකාවේ උසම දිය ඇලි අතර දහවැනි ස්ථානය හිමිකර ගනියි. මෙම ප්‍රදේශය තුළ ගොඩ පතල් මැණික් කර්මාන්තය ද ඉතා ප්‍රසිද්ධය. ඓතිහාසික උරුමයක් වන මහයිංගන රාජමහා විහාරය ද එහි පවත්නා වාර්ෂික පෙරහැර මංගල්‍ය ද වටිනා ඓතිහාසික උරුමයක් ලෙස හැදින්විය හැක. මෙම අධ්‍යයනය තුළ දී අවධානය යොමු කරන ප්‍රධානතම අධ්‍යයන වන්නේ බින්තැන්න ප්‍රදේශය විදේශ සංචාරකයන්ට ආකර්ෂණයක් ඇති කළ හැකි අයුරින් ප්‍රවර්ධනය කරන්නේ කෙසේ ද යන්නයි. විදේශ සංචාරකයන්ගේ ඉහළ ආකර්ෂණයක් ලබා ගැනීම සඳහා සිදුකළ හැකි සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කිරීම මෙම පර්යේෂණයෙහි පරමාර්ථය වේ. මෙහිදි අවදානය යොමුකරන අධ්‍යයන ක්‍රමවේද ලෙස සංචාරකයින් 20 දෙනෙක් යොදාගෙන ප්‍රශ්නාවලි ලබා දීම හරහා දත්ත එක්රැස් කර ඇත. තව ද ක්ෂේත්‍ර අධ්‍යයනය ග්‍රන්ථ පරිශීලනය ආදිය යොදා ගනිමින් මෙම විමර්ශනයට අදාළ දත්ත රැස් කොට ඇත. ආදිවාසි ජනාවාසය, සොරබොර වැව, රත්න ඇල්ල, මහියංගනය රජමහා විහාරය ආශ්‍රිතව විදේශීය සංචාරක ආකර්ෂණය ඇති වන අයුරින් ඇති කළ හැකි සංචාරක ක්‍රියාකාරකම් ද, මෙම ප්‍රදේශය තුළ විදේශිකයන්ට ලබා දිය හැකි ආකාරය ආදි සොයා ගැනීම් පිළිබඳ මූලික අවදානය මෙම පර්යේෂණයේදී සිදු වේ. තව ද නවාතැන් පද්ධතිය තව දුරටත් නගා සිටු විය යුතු අතර යටිතල පහසුකම් ද තවදුරටත් සංවර්ධන කිරීම හා තොරතුරු ලබා ගැනීම සඳහා වන ප්‍රචාරණයන් හා අදාළ වෙබ් අඩවි පිළිබඳ අවදානය ආදිය වැඩි කිරීම මෙම අධ්‍යයනය හරහා සොයාගත් යෝජනා ලෙස දැක්විය හැකිය.

ප්‍රමුඛ පදඃ බින්තැන්න,ආදිවාසී ජනාවාස, මහියංගන රජමහා විහාරය

* පුරාවිද්‍යා අධ්‍යන අංශය, කැලණිය විශ්වවිද්‍යාලයdahamsh4@gmail.com / thashmilarc@gmail.com